# ලොව වටා පුවත් වියමන

## ඔබාමා ගේ පසුගමන

නොවැම්බරයේ ලෝකයේ වෙසෙස් අවධානයට ලක්වූ පුද්ගලයා බවට පත්වූයේ ඇමරිකා එක්සත් ජනපද ජනාධිපති බැරැක් ඔබාමාය.

නොවැම්බර් 02 දා පැවැති ඇමරිකා එක්සත් ජනපද මධ්‍යවාර මැතිවරණයෙන් ඔබාමාගේ පක්ෂය පරාජයට පත්වී විපක්ෂය ජය හිමි කරගත්තේය. ඔබාමා ජනාධිපති ධූරයට පත්වීමෙන් පසු එතෙක් ඔහු දිනා සිටි ජනප්‍රසාදය ක්‍රම ක්‍රමයෙන් අඩුවෙමින් පවතින බව වරින් වර එරට



පවත්වන ලද ජනමත සමීක්ෂණ ගණනාවක් මගින් අනාවරණය කර තිබිණ. මධ්‍යවාර මැතිවරණයේදී මහජන නියෝජිත මණ්ඩලයේ බලය ඔහුගෙන් ගිලිහී යාමෙන් ඒ බව තවදුරටත් තහවුරු විය. මැතිවරණයේදී මහජන නියෝජිත මණ්ඩලයේ බලය රිපබ්ලිකන් පක්ෂයට හිමිවිය. පරාජයෙන් පසුව ඔබාමා ප්‍රකාශ කර සිටියේ මැතිවරණය පැරදුනද සිය දේශපාලන වැඩ පිළිවෙළ තවදුරටත් ඉදිරියට ගෙන යන බවය. ඒ සඳහා විපක්ෂයේද සහාය ලබාදෙන ලෙසද ඔහු ඉල්ලා සිටියේය.

මැතිවරණය පරාජය වීමෙන් දින කීපයකට පසු ඔබාමා ආසියානු රටවල සංචාරයක් අරඹමින් ඉන්දියාට පැමිණියේ නොවැම්බර් මස 06 වෙනිදාය. එදින ඉන්දියාවේ වෙළඳ අග නුවර ලෙස සැළකෙන මුම්බායිහිදී හෙතෙම දෙරට අතර ඇමරිකානු ඩොලර් මිලියන 10 ක වෙළඳ ගිවිසුමකට අස්සන් තැබීය. පසුදා නව දිල්ලි අගනුවරදී අගමැති මන්මෝහන් සිං හමුවූ ඔබාමා දෙරටටම වැදගත් වන දේශපාලන කරුණු කාරණා ගණනාවක් පිළිබඳ දීර්ඝ වශයෙන් සාකච්ඡා කළේය. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජිකත්වය ඉන්දියාවට ලබාදීමට ඇමරිකාව සහාය පළකරන බවට ඇමරිකානු ජනාධිපතිවරයා ඉන්දීය අගමැතිවරයා වෙත දැනුම්දීම එහිදී සිදුවූ විශේෂ අවධානයට ලක්වූ සිදුවීමකි. කලාපීය බලවතා වන චීනය ඒ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කළ බවක් නොපෙන්නුවද ඉන්දියාවට ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජිකත්වය ලබාදීමට ඇමරිකාව දක්වන උනන්දුව සම්බන්ධයෙන් පකිස්ථානය සිය නොසතුට සැගවූයේ නැත. එරට විදේශ අමාත්‍යාංශය ප්‍රකාශ කළේ බල දේශපාලනයේ වාසි තකා ක්‍රියා කිරීමෙන් ඇමරිකාව වැළැකිය යුතු බවය.

ඔබාමාගේ සංචාරයට විරෝධය පළකරමින්





ඉන්දියාවේ දේශපාලන කණ්ඩායම් කීපයක්ම විවිධ උද්ඝෝෂණ සංවිධානය කර තිබිණි. ඔබාමාගේ ආරක්ෂාව වෙනුවෙන් ඉන්දියාවේ විශේෂ ආරක්ෂක වැඩ පිළිවෙළක්ද ක්‍රියාත්මක කෙරුණි. ඉන්දීය සංචාරයේදී ඔබාමා නැවතී සිටියේ 2008 වසරේදී ත්‍රස්තවාදී ප්‍රහාරයක් එල්ල වූ මුම්බායිහි සුපිරිතම හෝටලය වන ටාජ්මහල් පැලස් හෝටලයේය. ත්‍රස්ත ප්‍රහාරයෙන් පුද්ගලයන් 166 දෙනෙකු මරුමුවට පත්ව 300 ක පමණ පිරිසක් තුවාල ලැබූ අතර විපතට පත්වූවන් සිහිකර උපහාර දැක්වීමටද ඔබාමා ක්‍රියා කළේය.

ඉන්දීය සංචාරය නිමවා ඔබාමා පැමිණියේ අග්නිදිග ආසියාවේ විශාලම රට මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක ලෙස ක්‍රියාත්මක කෙරෙන මුස්ලිම් රට ලෙස සැලකෙන ඉන්දුනීසියාවටය. ඇමරිකානු ජනාධිපතිවරයා සිය ළමා අවදියේ වසර ගණනාවක් ඉන්දුනීසියාවේ දිවිගෙවා තිබූ බැවින් ඔහුට මෙන්ම ඉන්දුනීසියා ජනතාවටද මේ සංචාරය කිසියම් ආශ්වාදයක් ගෙන දුන්නා නිසැකය. එහෙත් දෙපාර්ශ්වයටම ඒ ආශ්වාදය රිසිසේ විඳින්නට මෙරාපි ගිනිකන්ද ඉඩ දුන්නේ නැත.

ඉන්දුනීසියාවේ ජාවා දූපත්හි පිහිටි මෙරාපි ගිනි කන්ද නොවැම්බර් 07 දා යළි පිපිරීමෙන් පුද්ගලයන් 54 ක් ජීවිතක්ෂයට පත්වූ අතර අහසට නැගි දුම් සහ දූලි වළා හේතුවෙන් ගුවන් ගමන් වලටද බාධා ඇතිවිය. එය මුල්වරට පුපුරා ගියේ අගෝස්තු 26 දිනය. එහිදී මියගිය සංඛ්‍යාව 30 කි. ඉන්දුනීසියාවේ සංචාරය නිමවා ඔබාමා පිටත් වූයේ කලාපයේ තවත් බලවතෙකු වන දකුණු කොරියාවටය. ඇමරිකාව මෑතක සිට දකුණු කොරියාව සමඟ දැඩි මිත්‍රශීලිභාවයකින් කටයුතු කරන අතර කහ මුහුද ආශ්‍රිතව ඒකාබද්ධ නාවික යුද අභ්‍යාස පැවැත්වීමද මේ වසරේ ආරම්භයේ සිට දිගටම කරගෙන එයි. ඊට එරෙහිව උතුරු කොරියාව නිල නොවන ආකාරයෙන් යුද ප්‍රකාශ කර සිටින අතර කොයි මොහොතක හෝ දෙරට අතර යුද්ධයක් ඇතිවෙන පෙර නිමිති ද පළවෙමින් තිබේ.

ඇමරිකා ජනාධිපතිවරයා දකුණු කොරියාවට පැමිනෙන්නේ දෙරට ඒකාබද්ධව නොවැම්බර් 25දා තවත් නාවික අභ්‍යාසයක් කහ මුහුදේ සිදුකිරීමට සැළසුම් කර තිබියදීය. එහෙත් ඔබාමාගේ දකුණු කොරියා සංචාරයේ න්‍යාය පත්‍රයේ ඒ සම්බන්ධයෙන් කවරක් තිබුණේදැයි අනාවරණය වූයේ නැත. සංචාරයේදී ඔහු ප්‍රමුඛත්වය දුන්නේ ජී 8 සමුළුවට සහභාගී වීමටය. ඊට සහභාගිවීමෙන් අනතුරුව ඇමරිකානු ජනාධිපතිවරයා ජපානයට ගොස් ඇපෙක් සමුළුවට ද සහභාගි වී සිය ආසියානු සංචාරය අවසන් කළේ නොවැම්බර් 15 දාය.

## අවුන් සාන් සුකී

ඔබාමාගේ සංචාරය හේතුවෙන් ආසියාව දෙසට යොමුවී තිබූ ලෝක අවධානය තවදුරත් රඳවාගනිමින් තවත් සුවිශේෂී සිදුවීමක් මියන්මාරයෙන් වාර්තා වූයේ නොවැම්බර් 13 දිනය. ඒ වසර පහළොවක් පමණ නිවාස අඩස්සියේ සිටි මියන්මාරයේ විපක්ෂ දේශපාලනයේ දැවැන්ත ප්‍රතිරූපය වන අවුන් සාන් සුකී ට එරට පාලක හමුදා ජුන්ටාව මගින් නිදහස ලබාදීමය. මියන්මාරයට නිදහස දිනා දුන් ජෙනරාල් අවුන් සාන් ගේ

ශ්‍රීලාල් සෙනෙවිරත්න

දියණිය වන සුකී එරට පාලනය කරන හමුදා ජුන්ටාව විසින් නිවාස අඩස්සියට පත්කරනු ලැබුවේ 1990 පැවති මහ මැතිවරණයෙන් 59%ක වැඩි ඡන්ද ප්‍රතිශතයක් ලබා ඇයගේ පක්ෂය ජය හිමිකර ගැනීමෙන් පසුවය. සුකී ජයග්‍රහණය කළ ප්‍රතිපළය නිකුත්වීමෙන් පසු වහාම මැතිවරණය අවලංගු කර දැමූ පාලක හමුදා ජුන්ටාව ජනතා ඡන්දයෙන් තේරී පත්වූ රාජ්‍ය නායිකාව වූ සුකී නිවාස අඩස්සියට පත්කළේය. එතැන් සිට 2010 නොවැම්බර් 07 වෙනදා මහ මැතිවරණය පවත්වන තෙක් ගෙවුණු වසර විස්සක කාලය තුළ වසර පහළොවක්ම සුකී තබනු ලැබුවේ නිවාස අඩස්සියේය. ඒ සම්බන්ධයෙන් ජාත්‍යන්තරයෙන් එල්ල වූ බලවත් විරෝධය හෝ පැනවුණු ආර්ථික සම්බාධක නොතකා හැර විපක්ෂ දේශපාලනය එලෙස සිරගත කළ හමුදා ජුන්ටාව තමන්ට කැමති ආකාරයේ නව ආණ්ඩුක්‍රම



ව්‍යවස්ථාවක් ගෙනාවේය. නොවැම්බර් 07 දා මැතිවරණය පවත්වනු ලැබුවේ ඒ ව්‍යවස්ථාවට අනුවය. මැතිවරණයේ ජය හමුදා ජුන්ටාවට පක්ෂපාතී කණ්ඩායමට හිමි විය. සුකීගේ පක්ෂයට මැතිවරණයට ඉදිරිපත් වීමට අවස්ථාව නොදීම මෙන්ම මහා පරිමාණයෙන් සිදුකෙරුණු මැතිවරණ දූෂණ මගින් හමුදා ජුන්ටාව තවදුරටත් මියන්මාරයේ පාලනය බලය සතු කර ගත්තද ඉන් සතියක් ඉක්ම ගිය තැන සුකී නිවාස අඩස්සියෙන් මුදා හැරියේ සිය පාලනයට මැතිවරණය හරහා සුජාතභාවයක් ලබාගැනීමෙන් පසුවය.

## කලීඩා ෂියා නිල නිවෙසින් එළියට

නොවැම්බර් 13 දා සුකී නිදහස ලබන විට ඇයගේ ආධාරකරුවන් දහස් ගණනින් මියන්මාරයේ වීදි බැස ප්‍රීති ඝෝෂා කළහ. එහෙත් එදිනම අසල්වැසි රාජ්‍යයක් වන බංග්ලා දේශයේ වැසියන් දහස් ගණනින් වීදි බැස විරෝධතා දක්වමින් ප්‍රචණ්ඩ ක්‍රියාවල යෙදෙන්නට පටන් ගත්තේය. ඒ බංග්ලාදේශයේ විපක්ෂ නායිකා කලීඩා ෂියා එරට පොලිසිය විසින් ඇයගේ නිල නිවෙසින් එළියට ඇද දැමීම හේතුවෙනි.





බංග්ලාදේශයේ හිටපු අගමැතිවරියකද වන ෂියා වසර හතලිහක් තිස්සේ දිවි ගෙවූයේ ඩකා නුවර පිහිටි නිවෙසකය. ඇයගේ සැමියා, හිටපු ජනපති ජෙනරාල් සියා උර් රහමන්ගේ නිල නිවෙස වූ එය රජය විසින් බදු පදනමින් ෂියා වෙත ලබාදී තිබුණේ රහමන් හමුදා කුමන්ත්‍රණයකින් ඝාතනය වීමෙන් පසුවය. එවක රජය ලබා දී තිබූ බද්ද අවලංගු කර නිවෙස නැවත රජයට පවරගැනීමට වත්මන් අගමැතිනිය ශීක් හසීනා ක්‍රියාකළේය. එහිදී නිවෙසින් බැහැරවීම ප්‍රතික්ෂේප කර තවදුරටත් එහි රැඳී සිටි කලීඩා ෂියා පොලිස් කණ්ඩායමක් පැමිණ නිවෙසින් එළියට ඇද දමනු ලැබුවේ 13 දාය. ඉන් කුපිත වූ ඇයගේ ආධාරකරුවන් වීදි බැස ප්‍රචණ්ඩ ක්‍රියා ඇරඹීමත් පොලිසිය හා ගැටුම් ඇති කරගැනීමත් හේතුවෙන් එදිනත් පසු දිනත් ඇතැම් නගර යුද පිටි බවට පත්වූ අතර සිය ගණනක් තුවාල ලබා තවත් පිරිසක් පොලිස් අත්අඩංගුවටද පත්වූහ.

## උතුරු සහ දකුණු කොරියා දෙවන වෙඩි මුරය

උතුරු සහ දකුණු කොරියා දෙරට අතර යුද්ධයක් සඳහා වන දෙවන වෙඩි මුරයද උතුරු කොරියා යුද හමුදාව විසින් නිකුත් කිරීම ලෝක සාමය පතන ජනතාව ශෝකයට පත්කළ සිදුවීමකි. දකුණු කොරියාවේ දූවක් වන සිවිල් ජනතාව ජීවත්වන යොං පියොං වෙත උතුරු කොරියානු හමුදාවේ කාල තුවක්කු ප්‍රහාර ගණනාවක් එල්ල වූයේ නොවැම්බර් 23 දාය. එම ප්‍රහාරයෙන් දකුණු කොරියා හමුදා භටයන් දෙදෙනෙකු සහ සිවිල් වැසියන් දෙදෙනෙකු ජීවිතක්ෂයට පත්වූ අතර විශාල දේපොළ හානියක්ද සිදුවිය.

1950 - 53 දෙරට අතර සිදුවූ යුද්ධයෙන් පසු එක් රටක සිවිල් ප්‍රදේශයකට අනෙක් රටෙන් හමුදා ප්‍රහාරයක් එල්ල වූ ප්‍රථම අවස්ථාව මෙය විය. එම ප්‍රහාරය දකුණු කොරියා ජනයාගේ බලවත් කෝපයට හේතු වූ අතර එයට ප්‍රති ප්‍රහාර එල්ල කරන ලෙස රජයට බලකරමින් විරෝධතා උද්ඝෝෂණද ක්‍රියාත්මක විය. ජනතා විරෝධය කෙතරම් බලවත් ආකාරයෙන් නැගුනේද යත් විරෝධතාකරුවන් සහ පොලිසිය අතර දරුණු ගැටුම් හටගත් අතර අවසා-



නයේ එරට ආරක්ෂක ඇමැති කිම් සේයුංට සිය ඇමැති කමෙන් ඉල්ලා අස්වෙන්නට පවා සිදුවිය.

දකුණු කොරියාවට මේ ප්‍රහාරය එල්ල වූයේ ඇමරිකාව හා ඒකාබද්ධ නාවික අභ්‍යාසයක් පැවැත්වීමට නියමිත දිනට දෙදිනකට පෙරය. කෙසේ වුවද සැළසුම් කළ නාවික අභ්‍යාසය 28 දා ආරම්භ කෙරිණ.

දෙරට අතර යුද උණුසුම ඉහළ ගියේ ඉකුත් මාර්තු 26 දා දකුණු ොකාරියාවට අයත් යුද නැවක් අභිරහස් ලෙස පුපුරා එහි සිටි නාවික භටයන් 46 දෙනෙක් සමඟ මුහුදුබත් වීමත් ඒ සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂණයකින් පසු එය උතුරු කොරියාව විසින් සිදුකරන ලද්දක් බව ප්‍රකාශයට පත්වීමත් සමගිනි. අනතුරුව දකුණු කොරියාව ඇමරිකාව සමග එක්ව නාවික යුද අභ්‍යාස කිහිපයක්ම පැවැත්වූයේ සිය රටේ යුද ශක්තිය ප්‍රදර්ශණය කරමිනි. එම නාවික අභ්‍යාස සඳහා ඇමරිකා එක්සත් ජනපද නාවික හමුදාවේ යුද නැව්, ගුවන්යානා සහ හමුදා භටයෝ දස දහස් ගණනක්ද සහභාගීවූහ. මේ හැසිරීම සම්බන්ධයෙන් උතුරු කොරියාව සිය බලවත් විරෝධය ප්‍රකාශයට පත්කළ අතර ඒවා නවත්වන ලෙසත් එසේ නොකළහොත් න්‍යෂ්ඨික අවි යොදාගෙන දකුණු කොරියාවට සහ ඇමරිකාවට ප්‍රහාර එල්ල කරමින් ශුද්ධ යුද්ධයක් අරඹන බවත් උතුරු කොරියා ජාතික ආරක්ෂක කොමිසම නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේය. එහෙත් ඒ පිළිබඳ තැකීමකින් තොරව නාවික අභ්‍යාස ක්‍රියාත්මක කෙරුණු අතර ප්‍රතිචාර වශයෙන් දකුණු කොරියාවේ ඉලක්ක කීපයක් වෙත උතුරු කොරියාව ජුලි මාසයේ ෂෙල් ප්‍රහාර එල්ල කළේය. එහෙත් සැප්තැම්බර් මාසයේදී දෙරට අතර දෙරට අතර හමුදා මෙහෙයුම් සම්බන්ධයෙන් වසර දෙකකට අදාළ සැළසුමක් සම්බන්ධයෙන් එකගතාවක් ඇතිකරගැනීමට සාකච්ඡා කිරීමට දෙරටේ රාජ්‍ය නායකයන් එකඟවීම නිසා තත්ත්වය සමනය වනු ඇතැයි දේශපාලන විචාරකයෝ මත පළ කර තිබුණි. ඇමරිකාව හා එක්ව දකුණු කොරියාව තවත් යුද අභ්‍යාසයක් නොවැම්බර් 25 දින ක්‍රියාත්මක කිරීමට සැළසුම් කෙරුණේ එවන් පසුබිමකය. උතුරු කොරියාව කාල තුවක්කු ප්‍රහාර එල්ල කළේ එම යුද අභ්‍යාසයට සහභාගීවීම සඳහා භට පිරිස් සහ යුද අවි රැගෙන ඇමරිකාවට අයත් ජෝර්ජ් වොෂින්ටන් යුද නැව කොරියානු මුහුදු තීරය සමීපයේ කහ මුහුදට පැමිණ සිටියදීය.

## සැනකෙළියේ කඳුළු



ලෝකයේ වෙසෙස් අවධානයට ලක්වූ තවත් ඛේදවාචකයක් කාම්බෝජයෙන් වාර්තා වූයේ නොවැම්බර් 22 දිනය.

'ටොන්ලේ සැප්' කාම්බෝජයේ නොම්පෙන් අගනුවර